## පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

# දේශීය සංවර්ධන ආධාරක ව්‍යාපෘතිය (LDSP) සඳහා කාර්ය මණ්ඩලය බඳවාගැනීම

**1. ප්‍රාදේශීය සංවර්ධන ආධාරක ව්‍යාපෘතිය (LDSP)**

ප්‍රා.සං.ආ. ව්‍යාපෘතියට ලෝක බැංකුවේ ණය මුදලකින් සහ යුරෝපා සංගමයේ හා ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදනයකින් අරමුදල් සැපයේ. ව්‍යාපෘතියේ අරමුණ "ප්‍රතිචාරාත්මක හා වගකිවයුතු ආකාරයකින් ප්‍රජාවන් වෙත සේවා ලබාදීමෙහිලා පළාත් පාලන අධිකාරීන්ගේ හැකියාවන් ශක්තිමත් කරලීම හා සහභාගිවන පළාත් තුළ ආර්ථික යටිතල සංවර්ධනයට සහාය වීම" වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැය ඇ.ඩොලර් මිලියන 100.85 කි. ව්‍යාපෘතියේ කාලසීමාව වසර 4 කි. (2019-2022)

උතුරු, නැගෙනහිර, උතුරු මැද සහ ඌව පළාත් තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PIU) 4 ක් සමග ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයක් (PCU) පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ස්ථාපනය කොට ඇත.

ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් මට්ටම |
|---|---|---|---|
| 1. | ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | PS 1 |
| 2. | ව්‍යාපෘති ඉංජිනේරු | 01 | PS 04 - A |
| 3. | සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | 01 | PS 04 - A |

**පොදු කොන්දේසි**

- ශ්‍රී ලාංකික පුරවැසියන් පමණක් අයදුම්කිරීමට සුදුස්සෝ වෙති.
- විදේශ අරමුදල් ලබන ව්‍යාපෘති පිළිබඳ පළපුරුද්ද සහිත අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාව හිමිවේ.
- **තෝරා ගැනීමේ ක්‍රමය** : සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.
- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 64 ට අඩුවිය යුතුය.
- **රැකියා නියුක්තියේ කොන්දේසි** : සියලුම පත්වීම් මූලිකව එක් වසරක කාලයකට කොන්ත්‍රාත් පදනම මත වන අතර සතුටුදායක කාර්යසාධනය මත පදනම්ව ව්‍යාපෘති කාලසීමාව දක්වාම දීර්ඝ කළ හැකිය.
- සේවකයාගේ අර්ථසාධක අරමුදල් (EPF) දායකත්වය මාසික වැටුපෙන් 8% ක් වන අතර සේව්‍යයාගේ දායකත්වය 12% ක් හා සේවක භාරකාර අරමුදල (ETF) සඳහා 3% ක් ද වේ.
- රාජ්‍ය / අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
- අදාළ සුදුසුකම් හා පළපුරුද්ද සහිත විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් යළි සේවයේ පිහිටුවීමේ පදනම මත බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.
- උනන්දුවක් දක්වන සියලුම පුද්ගලයින්ට තම ජීව දත්ත සහිත අයදුම්පත් අදාළ අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග 2022-01-03 වන දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර, කොළඹ - 02, යුනියන් පෙදෙස, නො. 330, පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ, ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය.
- ඔබේ ජීවදත්ත සහිත අයදුම්පතේ ඍජු පිටපතක් (advance copy Word Format (Font - Times New Roman, Font Size - 12) මගින් හා අදාළ අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත් PDF Format මගින් විද්‍යුත් තැපැල් ලිපිනයට - Projects.recruitment@pclg.gov.lk වෙත යොමු කරන්න.
- **තනතුරෙහි, ව්‍යාපෘතියෙහි නම ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කරන්න.**
- **ඔබ එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.**
- අසම්පූර්ණ අයදුම්පත්, අධ්‍යාපන හා පළපුරුද්ද පිළිබඳ සහතික සමග නොඑවන අයදුම්පත් හා අවසාන වේලාවට පසුව ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ.යු.** තනතුරු සඳහා වන සුදුසුකම්, පළපුරුද්ද, වැටුප් පරාසය සහ වැඩිදුර තොරතුරු සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 සහ අමාත්‍යාංශ වෙබ් අඩවිය - www.mpclg.gov.lk වෙත යොමු කරන්න.

**ලේකම්,**
**පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය.**